රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සමාන්‍ය / විශේෂ) උපාධි 2000 ස්ථලය**

**දෙවන සමාසික පරීක්ෂණය 2018 මැයි**

**SLS 22563 / SLS 22663 – ජන සාහිත්‍ය අධ්‍යයනය**

<u>ප්‍රශ්න පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය.

**කාලය: පැය 03**

1. ජන සාහිත්‍ය යන්න නිර්වචනය කොට එය අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

2. ප්‍රාදේශීය අනන්‍යතාව ජනකවිවලින් සුරක්ෂිතව විද්‍යමාන වන ආකාරය විමර්ශනය කරන්න.

3. "පුරාණෝක්තියක (Mith) මූලික ලක්ෂණය වන්නේ ආගමික පසුබිමයි." අභිමත පුරාණෝක්ති දෙකක් (02) ඇසුරෙන් විශද කරන්න.

4. "ජනකවියා ව්‍යංග්‍යාර්ථයෙන් සහ සංකේතානුසාරයෙන් බොහෝ දේ පවසන්නට සමත් වෙයි." සනිදර්ශනව විභාග කරන්න.

5. භාරතීය ජනකතාවල සම්භවය පිළිබඳ මත දක්වා ඒවා ලෝකයේ ව්‍යාප්ත වීමේ දී ආගමික හා සංස්කෘතික වශයෙන් සිදු වී ඇති වෙනස්කම් කවරේ දැ යි පැහැදිලි කරන්න.

6. කෝලම් නාටකය දහ අට සන්නි යාගයෙන් ම ප්‍රභවය වූවක් සේ සැලකිය හැකි දැ යි පරීක්ෂා කරන්න.

7. "සොකරි නැටුම වූ කලී පත්තිනි දේවතාවිය උදෙසා කෙරෙන යාතු කර්මයකි." නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

8. "ජනකලා - සෞන්දර්ය උත්පාදනයෙහි ලා සාමූහිකත්වය ප්‍රබල සාධකයක් බවට පත් වේ." පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි)

@@@@@@@@@@@